ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - **2024**

----------------------------------------

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** අභිතකර මතය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යයසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **අභිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අභිතකර මතයක් නිකුත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතයේ 39 වන ඡේදයට අනුව දේපළ, පිරියත හා උපකරණ නැවත අගය කිරීමේදී වන අතිරික්තය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දැක්විය යුතුය. සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය සතු ඉඩම් සහ ගොඩනැගිලි අයිතම 08 ක් නැවත අගය කිරීමේදී රු.1,576,346,000 ක අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට ගිණුම්ගත කර තිබුණද, එම වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ නිරූපණය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම එම වටිනාකමින් අඩු වී තිබුණි. එමෙන්ම එම ප්‍රමිතයෙහි 36 ඡේදය ප්‍රකාරව කිසියම් දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරනු ලබන්නේ නම් එකී දේපළ, පිරියත උපකරණ පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, මණ්ඩලය 2023 සහ 2024 වර්ෂයන් වලදී ඉඩම් හා ගොඩනැගිලි වලින් කොටසක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. | විගණන විමසුමෙහි පෙන්වා දී ඇති අගය නිවැරදි වන අතර, 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි මෙම වටිනාකම විස්තීරණ ආදායම් තුළ ගැලපීම් කිරීමට කටයුතු කරනු ඇත. | දේපළ, පිරියත හා උපකරණ නැවත අගය කිරීමේදී වන ප්‍රත්‍යාගණන අතිරික්ත වටිනාකම විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ වෙනත් විස්තීරණ ආදායම් යටතේ නිරූපණය කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (LKAS 07) මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රමිතයේ 20 වන ඡේදයට අනුව මුදල් ප්‍රවාහ නොවන ආදායම් ශුද්ධ ලාභයට ගැලපිය යුතු වුවත් වෙනත් ආදායම් යටතේ දක්වා තිබූ රු.7,298,811 ක තොග ගැලපීම් ගිණුම් ශේෂය සහ රු.5,869,576 ක් වූ ඉන්ධන තොග අතිරික්තය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ වර්ෂයේ ශුද්ධ ලාභයෙන් අඩු කර නැවත එම වටිනාකම් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ශුද්ධ ලාභයට එකතු කර තිබුණි. | මෙම වටිනාකම් මුදල් ජනනය නොවන අයිතම වන අතර ලාභය ගැලපීම පමණක් සිදු කරනු ලබයි. විගණන විමසුමක් මඟින් පෙන්වා දී ඇති පරිදි මෙම ගැළපීම සිදු කර ඇත. | ගණුදෙනු මුදල් ප්‍රවාහ ප්‍රකාශයට නිවැරදිව ගැළපිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (LKAS 07) මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රමිතයට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය බදු අය කිරීමට පෙර ශුද්ධ ලාභය පදනම් කර ගෙන පිළියෙල කළ යුතු වුවත්, බදු පසු ලාභය පදනම් කර ගෙන පිළියෙල කර තිබීමෙන් සමාලෝචිත වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයට ගෙවන ලද බදු වටිනාකම රු.329,680,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගැළපීමට නොහැකි වී තිබුණි. | එය වෙනම පෙන්වීමට අතපසු වී ඇත. 2025 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී එය නිවැරදි අයුරින් වාර්තා කිරීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 (LKAS 10) වාර්තාකරන දිනට පසුව ඇති වූ සිදුවීම් ප්‍රමිතයට අනුව වාර්තාකරන දිනයත් මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කරනු ලබන දිනයත් අතර සිදුවන වාර්තා කරන දිනයට සාක්ෂි සපයන සිදුවීම් මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට මණ්ඩලයට එරෙහිව මාර්ග අනතුරක් වෙනුවෙන් ගොනුකර තිබූ අංක 2004/එම් නඩුවේ තීන්දුව බණ්ඩාරවෙල දිසා අධිකරණය මගින් වාර්තා කරන දිනට පසු කාලපරිච්ඡේදය තුළදී ප්‍රකාශයට පත් කර තිබුණි. ඒ අනුව රු.6,951,216 ක මුදලක් අගතියට පත් වූ පාර්ශවයට ගෙවීමට නියම වී තිබුණ ද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල වෙමින් මෙම ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය අවසන් දිනට මණ්ඩලයේ අලාභය එම වටිනාකමින් අඩු වී තිබුණි. | 2025 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශයන් සකස් කිරීමේදී සියලු නෛතික ගැටළු සම්බන්ධව වෙන් කිරීමක් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) හි 07 වන ඡේදයට අනුව යම් දේපළ, පිරියත හා උපකරණයක පිරිවැය වත්කමක් ලෙස හඳුනාගැනීමට නම් එම වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්ථිත්වය තුළට ජනිත කරවීමේ හැකියාවක් පැවතිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.1,367,754,792 ක් වූ භාවිතයට ගත නොහැකි ලෙස සම්පූර්ණයෙන් අබලි වූ බස් රථ සහ රු.1,041,195 ක් වූ භාවිතයට ගත නොහැකි ලෙස අබලි වූ අනෙකුත් වාහන දේපළ, පිරියත හා උපකරණ ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබූ බැවින්, දේපළ, පිරියත හා උපකරණ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ස්ථාවර වත්කම් පිළිබඳ අධ්‍යනය කර වාර්තාවක් ලබාගැනීම සඳහා බාහිර ආයතනයක සහාය ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදෙන තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | සම්පූර්ණයෙන් අබලි වූ බස් රථ වටිනාකම දේපළ, පිරියත හා උපකරණ ගිණුමෙන් ඉවත් කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතයේ 07 වන ඡේදයට ප්‍රකාරව යම් දේපළ, පිරියත හා උපකරණ අයිතමයකින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්ථිත්වය තුළට ජනිත කිරීමේ හැකියාව හා පිරිවැය විශ්වාසවන්ත ලෙස මැනිය හැකි වීම යන නිර්ණායක මත වත්කම් ලෙස හඳුනාගත යුතු වුවද, 2023 වර්ෂයේදී අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම | මෙම අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම ඈවර කිරීමේ කටයුතු සිදු කර අවසන් වාර්තාවක් ශ්‍රී ලං.ග.ම. වෙත ලබාදී නොමැත. එහි වත්කම් හා වගකීම් සම්බන්ධව ශ්‍රී ලං.ග.මට | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව පවරාගෙන තිබූ වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සතු වන බස් රථ 20 ක් රු.මිලියන 109.4 ක තක්සේරු වටිනාකමට පවරාගෙන ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 63.45 ක් ගෙවා තිබුණද, තවදුරටත් ගෙවිය යුතු රු.මිලියන 45.95 ගිණුම්ගත කර නොතිබුණි. එමෙන්ම අදාළ බස් රථ 20 හි තක්සේරු වටිනාකම දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට ද කටයුතු කර නොතිබුණි. 2023 වර්ෂයේදී අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම පවරා ගැනීමේදී එම සමාගමේ වගකීම් වශයෙන් පැවති රු.මිලියන 114.97 ක් වූ වටිනාකමෙන් මණ්ඩලයට පවරා ගන්නා ලද බස් රථවල වටිනාකම වූ රු.මිලියන 109.4 හිලව් කර තිබූ අතර, තවදුරටත් පැවති වගකීම් වටිනාකම වූ රු.මිලියන 5.57 ක් මණ්ඩලයේ වගකීමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නීත්‍යානුකුල අයිතියක් හිමිවී නොමැත. | |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 (LKAS 37) වෙන් කිරීම්, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතයට අනුව අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් මණ්ඩලයට වර්තමාන බැඳීමක් පවතින්නේ නම් හා එම බැඳීම නිරාකරණය කිරීම පිණිස මුදල් පිටතට ගලා යාමේ හව්‍යතාවයක් ඇති බැවින් හා එම බැඳීමේ ප්‍රමාණය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කර ඇත්නම් එම මුදල වෙනුවෙන් ප්‍රතිපාදනයන් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මාර්ග අනතුරු වෙනුවෙන් වන්දි ලෙස ගෙවිය යුතු වටිනාකම ලෙස හඳුනාගෙන තිබූ රු.2,171,281,116 ක් වෙනුවෙන් ප්‍රතිපාදනයන් සිදු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නීති අංශයෙන් මේ සම්බන්ධව තොරතුරු විමසා බලා අදාළ සටහන් තැබීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරන ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රතිපාදනයන් වෙන් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට මණ්ඩලය සතුව ශුද්ධ අගය රු.1,000 ක් වූ බස් රථ 5,297 ක් හා ශුද්ධ අගයක් නොමැති බස් රථ 04 ක් අවසන් ගිණුම් තුළ නිරූපණය කරනු ලබන නමුත් එම බස් රථවලින් සියයට 93 ක් වර්තමානය වන විටද මෙහෙයුම් කටයුතු සඳහා යොදවා තිබූ අතර එම බස් රථ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම බස්රථ ශ්‍රී ලං.ග.ම. තුළ ප්‍රවාහන කටයුතු සඳහා භාවිතා කරමින් පවතී. වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය සහ ලෙජර ගිණුම සමඟ සංසන්දනය කර වාර්තාවක් ලබාදීම සඳහා බාහිර විගණන ආයතනයක සේවාව ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. | ප්‍රත්‍යාගණනය කළ යුතු වත්කම් පංතිය හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ බදු පෙර ශුද්ධ ලාභයට සිදු කරනු ලබන ගැලපීම් යටතේ වර්ෂයේ පොලී ආදායම ලෙස රු.278,822,033 ක් අඩුකර තිබූ අතර, එම මුළු වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමේ ප්‍රවාහයක් ලෙස නැවත එකතු කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.9,497,720 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ලැබූ පොලී ලෙස ගලපා තිබූ බැවින් ලැබූ පොලී එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | අදාළ දෝෂය සිදු වී ඇත. 2025 මූල්‍ය වාර්තා සකස් කිරීමේදී මේ පිළිබඳ සැලකිල්ල යොමු කර මුදල් ප්‍රවාහ ප්‍රකාශන සකස් කිරිමට කටයුතු කරනු ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අශෝක් ලේලන්ඩ් සමාගමට අයත් අධිසුඛෝපභෝගී බස් රථ අධිවේගී මාර්ගවල ධාවනය කිරීමෙන් ලද මාර්ග ලේඛන ආදායම රු.1,970,861,418 ක් වූ අතර, ඒ සඳහා ඉන්ධන හා පිවිසුම් ගාස්තු වියදම ලෙස රු.580,292,773 ක් දරා තිබුණි. එම ආදායම හා වියදම සමාලෝචිත වර්ෂයේ විස්තිරණ ආදායම් ප්‍රකාශනයට ගෙන නොතිබුණු අතර, මණ්ඩලයට ලැබිය යුතු සියයට 15 ක් වන කොමිස් මුදල වූ රු.208,585,297 ක් පමණක් විස්තිරණ ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබුණි. | නිවැරදි ක්‍රමවේදයක් සකස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්‍රිකාවක් යොමු කර ඇත. එහි තීරණය මත ගිණුම් තැබීමේ කටයුතු සිදු කරනු ඇත. | ආදායම් හා වියදම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | කටුබැද්ද අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයට හා මතුගම ඩිපෝවට අයත් පිරිවැය රු.15,672,007 ක් වූ බස් රථ දෙකක් පිළිවෙලින් 2014 සහ 2023 වර්ෂයන් වලදී අනතුරු වලට ලක් වී අබලි තත්ත්වයට පත් වී ඇතත්, එම බස් රථ දේපළ, පිරියත හා උපකරණ උප ලේඛනයෙන් ඉවත් කර බස් රථ ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙකී බස්රථ දෙකම බස්රථ ඇණියෙන් ඉවත් කිරීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කාර්මික) තැන වෙත දැනුම් දී ඇත. ඒ අනුව මෙම බස්රථ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | අබලි බවට පත් වූ වත්කම් අදාළ අනුමැතීන් මත පොත් වලින් ඉවත් කිරිමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මහරගම සහ අංගොඩ ඩිපෝවන් වල සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සංශෝධිත මුදල් ගිණුම අනුව රු.4,919,470 ක් වූ බැංකු අයිරා ශේෂය රු.6,151,760 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබීමෙන් බැංකු අයිරා ශේෂය රු.1,232,290 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2025 වර්ෂය තුළදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ලෙජර් ගිණුම් ශේෂයන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වලට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මඩකලපුව ඩිපෝවේ හඳුනා නොගත් රු.4,585,117 ක බැර ශේෂයන් මූල්‍ය ප්‍රකාශන වල බැංකු අයිරා ශේෂයක් ලෙස දක්වා තිබීමෙන් බැංකු අයිරා ශේෂය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම ගිණුම්වලට අදාල ශේෂයන් දැනට අක්‍රීය තත්ත්වයේ පවතින අතර මීට අදාළ ගනුදෙනු සටහන් කර 2025 වර්ෂයේදී අදාළ නිවැරදි කිරීම් සිදු කරනු ඇත. | බැංකු ප්‍රකාශන අනුව බැංකු සැසඳුම් ප්‍රකාශන නිවැරදිව සකස් කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.14,571,053 ක් වූ වෙළඳ ණයගැති ශේෂය තුළ වසර 05 ත් 10 ත් අතර රු.1,544,568 ක් ද වසර 01 ත් 05 ත් අතර රු.12,449,383 ක් ද ලෙස පැවතියද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් හානි කරන අලාභ සඳහා ඉඩ හැරීමක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | වැරදි ගිණුම්ගත කිරීම් හේතුවෙන් මුදල් නිරවුල් නොවී ඉදිරියට පැමිණ ඇත. 2025 වර්ෂය තුළදී අදාළ නිරවුල් කිරීම් සිදු කර ඇත. | වෙළඳ ණයගැතියන් සඳහා හානි කරන අලාභ සඳහා ඉඩ හැරීමක් සිදු කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.86,956,445 ක් වූ මාර්ගස්ථ මුදල් ශේෂය තුළ වසර 01 සිට 02 දක්වා කාලයක් පැරණි වූ රු.21,500 ක් ද වසර 02 සිට 05 දක්වා කාලයක් පැරණි වූ රු.13,827,779 ක් ද වසර 05 සිට 10 දක්වා කාලයක් පැරණි වූ රු.7,261,972 ක සෘණ ශේෂයක් හා රු.2,079,469 ක ශේෂයක් ද වසර 10 ට වැඩි වූ රු.32,007,986 ක ශේෂයක් හා රු.813,428 ක සෘණ ශේෂයක් ද පැවතුණි. මෙසේ මාර්ගස්ථ මුදල් ඊළඟ ගිණුම් වර්ෂයේ මුල් දින කිහිපය තුළ මණ්ඩලයේ බැංකු ගිණුමට ලැබිය යුතු වුවද දීර්ඝ කාලසීමාවක් මෙම වටිනාකම් මාර්ගස්ථව පැවතුණි. තවද රු.8,075,400 ක සෘණ ශේෂය තහවුරු කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි. | දීර්ඝ කාලයක සිට පැවත එන ගිණුම් තැබීමේදී සිදු වූ වැරදි හා අඩුපාඩු හේතුවෙන් මෙම ශේෂයන් ජනිත වී ඇත. ඉදිරියේදී මේ පිළිබද කරුණු සොයා බලා අභ්‍යන්තර විගණන අංශය වෙත යොමු කර ඔවුන් විසින් ලබාදෙන නිර්දේශය අනුව කටයුතු කරනු ඇත. | දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන සෘණ ශේෂයන්හි වැරදි අඩුපාඩු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2020 සහ 2021 වර්ෂවල කොවිඩ් කාලවකවානුව තුළදී රෝහල් කාර්ය මණ්ඩලය ප්‍රවාහනය වෙනුවෙන් ලැබිය යුතු රු.53,587,118 ක් අදාළ වර්ෂයන්හි ආදායමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත නොකර ප්‍රවර්ථන වර්ෂය තුළදී ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් අදාළ වර්ෂයන්හි මූල්‍ය ප්‍රතිඵලය හා මූල්‍ය තත්ත්වය නිවැරදිව මූල්‍ය ප්‍රකාශන මගින් නිරූපණය වී නොතිබුණි. | ප්‍රවාහන සේවා වෙනුවෙන් ලැබිය යුතු මුදල් අදාළ වර්ෂ වලදී ගිණුම්ගත වී නොමැත. පසුව විගණන විමසුමක් මඟින් ඒ බව පෙන්වා දීමෙන් පසුව මෙම ලැබිය යුතු මුදල් 2024 වර්ෂයේදී ගිණුම්ගත කර ඊට අදාළ සටහන් තබන ලදී. | වර්ෂයට අදාළ ආදායම් ඒ වර්ෂයේදීම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර පසුගිය වර්ෂවලට අදාළව හඳුනාගත් ආදායම් පෙර |

| | | | |
|---|---|---|---|
| | | | කාලපරිච්ඡේද යට ගැළපිය යුතුය. |
| (එ) | මණ්ඩලයේ අභ්‍යන්තර ප්‍රාදේශිකයන් අතර සිදුවන ගණුදෙනු වලට අදාළව ප්‍රාදේශිකයන් 07 කට අයත් රු.5,443,957 ක හික්ෂු කූපන් සහ අභ්‍යන්තර ගණුදෙනු සඳහා ලැබිය යුතු ගිණුම් ශේෂයන් 124 කට අදාළ වටිනාකම රු.89,706,455 ක් වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය තුළ සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති අතර, එම ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂ යටතේ දක්වා තිබීමෙන් ලැබිය යුතු ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂ 10 කට වඩා පැරණි වූ මෙම ශේෂයන් අභ්‍යන්තර ඩිපෝවන් අතර සිදු වූ ගණුදෙනු වේ. අදාළ සටහන් තැබීමේදී සිදුවූ වැරදි නිසා මෙම ශේෂයන් දිගින් දිගටම පැවත එන අතර ඉදිරියේදී මෙම ශේෂයන් නිවැරදි කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | අභ්‍යන්තර ගණුදෙනු ජංගම ගිණුම් හරහා නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ඩිපෝ 06 කින් සහ ප්‍රාදේශීය කාර්යාල 04 කින් හඳුනාගත නොහැකි හා ගිණුම්කරණ දෝෂ හේතුවෙන් හටගත් රු.8,603,078 ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපණය වන වෙළඳ සහ වෙනත් ලැබිය යුතු ශේෂය එම වටිනාකමින් වැඩියෙන් නිරූපණය වන අතර, ඒ තුළ වසර 10 කට වඩා වැඩි රු.492,003 ක ශේෂයක් ද, වසර 05 ත් 10 ත් අතර රු.2,600,222 ක ශේෂයක් ද, වසර 02 ත් 05 ත් අතර රු.5,510,853 ක ශේෂයක් ද පැවතුණි. | මෙම ශේෂ සම්බන්ධව විගණන අංශය වෙත යොමු කර ඇති අතර ඉන් ලබා දෙනු ලබන වාර්තා පදනම් කරගෙන එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ලබා දෙනු ලබන උපදෙස් අනුව ඉදිරියේදී ක්‍රියා කිරීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ දෝෂ හා හඳුනා නොගත් ශේෂයන් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | ප්‍රධාන කාර්යාලය විසින් බාහිර ආයතන සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් අවුරුදු 02 ත් 05 ත් අතර, කාලයක සිට පැවත එන රු.1,295,263 ක වටිනාකමට අදාළ පාර්ශවයන් මණ්ඩලයට මුදල් ගෙවා තිබුණද, එය වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට ණයගැති ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | සිදු වූ වරද 2025 වර්ෂය තුළදී නිවැරදි කර ඇත. ගිණුම් තැබීම වගකීමකින් යුක්තව කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | ගිණුම් තැබීමට අදාළ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (ඕ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ඩිපෝ 09 ක ණයහිමියන් 19 දෙනෙකුට අදාළව රු.26,288,120 ක් වූ වෙළඳ හා වෙනත් ණයහිමි හර ශේෂයක් පැවතීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | මේ පිළිබඳ කරුණු සොයා බලා 2025 වර්ෂය අවසානයේ නිවැරදි අයුරින් ගැලපීම් කිරීමට කටයුතු කරනු ඇත. | ණයහිමි ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | සමාගමකින් මිලදී ගන්නා ලද අමතර කොටස් සඳහා ගෙවීම් නොකිරීම හේතුවෙන් සමාගම බේරුම්කරන නඩුවක් පවරා තිබූ අතර, එය 2023 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් 3,076,068 ක් ගෙවීමෙන් සමථයකට පත් වීමට එකඟ වී තිබුණි. එම වටිනාකම නඩු තීන්දුව ප්‍රකාරව ප්‍රධාන කාර්යාලය විසින් ගෙවා තිබුණද ප්‍රාදේශීය කාර්යාලවල සහ ප්‍රාදේශීය වැඩපලවල රු.397,247,100 ක වටිනාකමක් ණයහිමි ශේෂ ලෙස පැවතීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ ණයහිමි ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් තැබීමේ වැරදි හා දෝෂ නිසා උද්ගත වූ ශේෂ වන බැවින්, ඉදිරියේදී මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරනු ඇත. | ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රාදේශීය වැඩපලවල ණයහිමි, ණයගැති ගිණුම් සැසඳීම් කාලානුරූපිව කළ යුතුය. |
| (ඛ) | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවට අනුව වගකීමක් හඳුනා ගැනීමට නම් එය අතීත ගණුදෙනුවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස හට ගැනීමත් එය නිරවුල් කිරීමේදී අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයෙන් පිටතට යාමේ හව්‍යතාවයක් පැවතීමත් වර්තමාන බැඳීමක් පැවතිය යුතු වීමත් යන සාධක පැවතිය යුතු වුවද, හඳුනාගත නොහැකි හා වැරදි ගිණුම්කරණ සටහන් හේතුවෙන් හටගත් එකතු වටිනාකම රු.269,047,118 ක් වූ වෙළඳ ණයහිමි හා වෙනත් ණයහිමි ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවතුණි. | 2025 වර්ෂය තුළදී මේ පිළිබඳ සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | වැරදි ගිණුම්කරණ සටහන් හා හඳුනා නොගත් ශේෂයන් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ග) | ගමනාගමන මණ්ඩලයේ අභ්‍යන්තර ප්‍රාදේශීය ඒකකයන් අතර සිදු කරන අභ්‍යන්තර හුවමාරු ගණුදෙනු ප්‍රාදේශීය ඒකක 45 කට අදාළ රු.32,885,995 ක වටිනාකමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ යටතේ දක්වා තිබීමෙන් ගෙවිය යුතු ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2025 වර්ෂය තුළදී මෙම ශේෂයන් නිවැරදි කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | අභ්‍යන්තර ගණුදෙනු ජංගම ගිණුම් හරහා නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඝ) | රත්මලාන ඉන්ධන පිරවුම්හලේ දෛනික තොග සහ විකුණුම් වාර්තාවන්ට අනුව සමාලෝචිත වර්ෂයට අදාළ ඉන්ධන සහ ලිහිසි තෙල් විකුණුම් ආදායම රු.477,560,510 ක් වුවද, එය රු.475,951,983 ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් විකුණුම් ආදායම රු.1,608,527 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි දෝෂ හා වැරදි වලින් තොරව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | ආදායම් නිවැරදිව ගිණුම්ගත වන පරිදි අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (ච) | රත්මලාන ඉන්ධන පිරවුම්හලේ වාර්තා අනුව 2024 වර්ෂය තුළ මිලදී ගන්නා ලද රු.335,413,584 ක් වටිනා ඩීසල් තොගය අවසන් ගිණුම් තුළ රු.336,308,757 ක් ලෙස දැක්වීමෙන් රු.895,173 ක් අවසන් ගිණුම් තුළ වැඩියෙන් ද, 2024 වර්ෂය තුළදී මිලදී ගන්නා ලද රු.131,718,653 ක් වූ | මිලදී ගැනීම් ගිණුම්ගත කිරීමේදී වැරදි අඩු පාඩු සිදු වී ඇති අතර ඒවා නිවැරදි කළද මෙයින් 2024 වර්ෂයේ ලාභයට බලපෑමක් සිදු නොවේ. | මිලදී ගැනීම් නිවැරදිව ගිණුම්ගත වන පරිදි අභ්‍යන්තර පාලනය |

| | | | |
|---|---|---|---|
| | පෙට්‍රල් තොගය රු.129,308,242 ක් ලෙස අවසන් ගිණුම් තුළ වාර්තා කිරීම මත රු.2,410,411 ක් අඩුවෙන් ද ගිණුම්ගත වී තිබුණි. | | ශක්තිමත් කළ යුතුය. |
| (ඡ) | භික්ෂු කූපන් සඳහා ලැබිය යුතු රු.2,913,736 ක් සහ පොලිස් වවුචර් වෙනුවෙන් ලැබිය යුතු රු.2,999,641 වශයෙන් වූ රු.5,913,377 ක වටිනාකම වෙනත් වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම වටිනාකමින් වැඩියෙන් ද ජංගම වත්කම් රු.2,999,641 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | භික්ෂු කූපන් හා පොලිස් වවුචර්පත් සම්බන්ධව ගිණුම් තැබිය යුතු නිවැරදි ආකාරය පිළිබඳව සියලු ඩිපෝවන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | ගණුදෙනු ගිණුම්ගත කිරීමේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (ජ) | 2020 සහ 2021 වර්ෂවලදී රෝහල් කාර්යය මණ්ඩලය ප්‍රවාහනය වෙනුවෙන් කිරිදිවැල ඩිපෝවට අයවිය යුතු රු.2,513,468 ක වටිනාකම පෙර වර්ෂයේ සමුච්චිත ලාභයට හර කිරීම හේතුවෙන් පෙර වර්ෂයේ ලාභය හා ලැබිය යුතු ශේෂය එම වටිනාකමෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2025 වර්ෂය තුළදී මීට අදාළ නිවැරදි කිරීම් සිදු කර ඇත. | ලැබිය යුතු ශේෂ නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඣ) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස වලට අදාළ කිරිදිවැල ඩිපෝවේ ලැබිය යුතු සිසුසැරිය රු.1,552,950 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට හඳුනා නොගෙන පෙර වර්ෂයේ සමුච්චිත ලාභයට ගැළපීම් කර ලැබිය යුතු ගිණුමෙන් කපා හැරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අලාභය අඩුවෙන් දක්වා තිබුණි. | 2025 වර්ෂය තුළදී මීට අදාළ නිවැරදි කිරීම් සිදු කර ඇත. | ලැබිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ට) | 2024 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කිරිදිවැල ඩිපෝවට ලැබිය යුතු පොලිස් වවුචර් වටිනාකම වූ රු.2,941,638 ක් ලැබිය යුතු ගිණුමට හර කිරීම වෙනුවට පෙර වර්ෂයේ සමුච්චිත ලාභ ගැලපුම් ගිණුමට ගළපා තිබීම හේතුවෙන් ලැබිය යුතු ශේෂය සහ පෙර වර්ෂයේ සමුච්චිත ලාභය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙකී ශේෂ සම්බන්ධව අභ්‍යන්තර විගණන අංශයෙන් ලබා දෙන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල වෙත යොමු කර ලබා දෙන තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | ලැබිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඨ) | අභ්‍යන්තර ණයගිම් ශේෂයක් ලෙස කැකිරාව ඩිපෝවේ ගිණුම්වල පැවති රජරට ප්‍රාදේශීය කාර්යාලයට ගෙවිය යුතු රු.1,000,000 ක මුදල සමාලෝචිත වර්ෂය තුළදී සමුච්චිත ලාභයට ගළපා පොත්වලින් ඉවත් කර තිබුණි. මෙය මණ්ඩලයේ අභ්‍යන්තර ණයගිම් ශේෂයක් බැවින් පොත්වලින් | අභ්‍යන්තර ඩිපෝ අතර, මුදල් හුවමාරුවක් වන අතර, සිදුව ඇති වැරදි නිවැරදි කිරීම සඳහා මෙම සටහන යොදන ලදී. | මණ්ඩලයේ අභ්‍යන්තර ගණුදෙනු ගිණුම්ගත කිරීමට අදාළ |

| | |
|---|---|
| ඉවත් කිරීමේදී සමුච්චිත ලාභයට ගැළපීම නිසා සමුච්චිත ලාභය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. | අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විෂයය | මූලාශ්‍ර ප්‍රකාශන අනුව වටිනාකම (රු.) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.) | වෙනස (රු.) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | මෝටර් වාහන පිරිවැය | 331,764,253 | 141,593,116 | 190,171,137 | ඉදිරියේදී දේපළ, පිරියත හා උපකරණ උප ලේඛනයේ ඇති ශේෂය සහ මූලාශ්‍ර ප්‍රකාශනයන් තුළ පවත්නා ශේෂයන් අතර වෙනස නිරාකරණයට පියවර ගනු ඇත. | උපලේඛන, ලෙජර් ගිණුම් හා මූලාශ්‍ර ප්‍රකාශන වල ශේෂයන් සසඳා නිවැරදි කිරීම් කළ යුතුය. |
| (ආ) | බස් රථ පිරිවැය | 32,443,839,162 | 30,161,984,715 | 2,281,854,447 | දේපළ, පිරියත හා උපකරණ උප ලේඛනයේ ඇති ශේෂය සහ මූලාශ්‍ර ප්‍රකාශයන් තුළ පවත්නා ශේෂයන් අතර පවත්නා වූ වෙනස ඉදිරියේදී නිරාකරණය කෙරෙනු ඇත. | උපලේඛන, ලෙජර් ගිණුම් හා මූලාශ්‍ර ප්‍රකාශන වල ශේෂයන් සසඳා නිවැරදි කිරීම් කළ යුතුය. |
| (ඇ) | කාර්යාල උපකරණ පිරිවැය | 255,849,892 | 178,779,950 | 77,069,942 | වෙනස ඉදිරියේදී නිරාකරණය කෙරෙනු ඇත. | ගිණුම් හා ලේඛන සැසඳීම් කර නිවැරදි කළ යුතුය. |
| (ඇ) | වෙනත් වත්කම් පිරිවැය | 75,842,984 | 70,624,478 | 5,218,506 | වෙනස ඉදිරියේදී නිරාකරණය කෙරෙනු ඇත. | ගිණුම් හා ලේඛන සැසඳීම් කර නිවැරදි කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඉ) | ටිකට් යන්ත්‍ර පිරිවැය | 266,417,397 | 261,441,077 | 4,976,320 | වෙනස ඉදිරියේදී නිරාකරණය කෙරෙනු ඇත. | ගිණුම් හා ලේඛන සැසඳීම් කර නිවැරදි කළ යුතුය. |
| (ඊ) | මහරගම ඩිපෝවේ මහජන බැංකු ඉතිරි කිරීමේ ගිණුමෙහි ශේෂය | 61,307,500 | 57,027,391 | 4,280,109 | වෙනස ඉදිරියේදී නිරාකරණය කෙරෙනු ඇත. | බැංකු ශේෂයන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | වෙළඳ ණයගැති ශේෂය | 98,034,414 | 2,041,325 | 95,993,089 | වෙනස ඉදිරියේදී නිරාකරණය කෙරෙනු ඇත. | ගිණුම් හා ලේඛන සැසඳීම් කර නිවැරදි කළ යුතුය. |
| (ඌ) | වෙළඳ ණයහිමි ශේෂය | 1,592,675,315 | 981,294,735 | 611,380,580 | වෙනස ඉදිරියේදී නිරාකරණය කෙරෙනු ඇත. | ගිණුම් හා ලේඛන සැසඳීම් කර නිවැරදි කළ යුතුය. |

**1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් රු.118,371,641 ක් ද, විවිධ ණයහිමි රු.83,545,053 ක් ද, දඩණය හා දඩණය අය කිරීම් රු.234,918,763 ක් ද, හිඟ වැටුප් අත්තිකාරම් රු.4,725,743 ක්, විවිධ ණයගැති රු.2,623,156 ක් හා වෙනත් ලැබිය යුතු ආදායම් රු.525,000 ක් ද රජරට ප්‍රාදේශීය කාර්යාලයට අයත් ඩිපෝවන් විසින් ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ 19 කට අදාළ රු.11,036,274 ක ශේෂයක් ද වශයෙන් වූ රු.455,745,630 ක් විධිවිධාන ප්‍රකාරව අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී පොත්වලින් කපා හැර පෙර වර්ෂයේ සමුච්චිත ලාභයට ගැලපීමට කටයුතු කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය අඩුවෙන් දක්වා තිබුණි. | අර්ථසාධක අරමුදල් ගිණුම් තැබීමේ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරන ලදී. දඩ ණය ගිණුම් තැබීමේ දෝෂයන් නිවැරදි කර ඇති බවට සඳහන් කරමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කපා හැරීම් සඳහා ක්‍රමවේදය අනුගමනය කර අනුමැතිය ලබා ගත යුතුය. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ක්‍රියාත්මක නොවූ ගිණුම් | 1,290,782,782 | ශේෂ තහවුරු කිරීම සඳහා විස්තරාත්මක උප ලේඛන. | මේ සඳහා විශේෂ කමිටුවක් පත් කර ඇත. නිර්දේශ ලබා ගෙන ඉදිරියේදී කටයුතු කරනු ඇත. | විස්තරාත්මක උපලේඛන සකස් කර රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය | 75,166 | මූලාශ්‍ර ලේඛන හා විස්තරාත්මක උප ලේඛන. | මෙම ශේෂ වර්ෂ 10 කට වැඩි, කිසිදු තොරතුරක් සොයා ගත නොහැකි අතර, අභ්‍යන්තර විගණන අංශය වෙත යොමු කර නිර්දේශ අනුව කටයුතු කරනු ඇත. | කමිටුවක් මඟින් විමර්ශනයක් සිදුකර රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | වෙළඳ ලැබිය යුතු ශේෂය | 26,412,773 | මූලාශ්‍ර ලේඛන හා විස්තරාත්මක උප ලේඛන. | මෙම ශේෂ වර්ෂ 10 කට වැඩි, කිසිදු තොරතුරක් සොයා ගත නොහැකි අතර, අභ්‍යන්තර විගණන අංශය වෙත යොමු කර නිර්දේශ අනුව කටයුතු කරනු ඇත. | කමිටුවක් මඟින් විමර්ශනයක් සිදුකර රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | අත්තිකාරම් ශේෂය | 3,257,762 | ශේෂ තහවුරු කිරීම සඳහා විස්තරාත්මක උප ලේඛන. | මෙකී ශේෂයන්ට අදාළ සේවකයින් සේවය අතහැර ගොස් හෝ විනය කටයුතු නිසා සේවය තහනම් කර ඇති අතර අභ්‍යන්තර විගණන අංශ | විස්තරාත්මක උපලේඛන සකස් කර රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

නිර්දේශ පරිදි ඉදිරියේදී කටයුතු කරනු ඇත.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 සහ 16 වන වගන්ති | සේවා යෝජක විසින් එක් එක් මාසයක් සම්බන්ධයෙන් ඊළඟ මාසයේ අවසාන දින හෝ එදිනට පෙර සේවක අර්ථසාධක දායක මුදල් අරමුදලට ගෙවීමට කටයුතු කළ යුතු අතර ප්‍රමාද වී ගෙවන ලද දායක මුදල් සඳහා අධිභාර අය කරනු ලබයි. මණ්ඩලය සේවක අර්ථසාධක දායක මුදල් ප්‍රමාද වී ගෙවීම මත සමාලෝචිත වර්ෂය තුළදී රු.26,505,105 ක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි. | වර්තමානයේදී අර්ථසාධක අරමුදල් නිසියාකාරව ගෙවනු ලැබේ. නඩු හා පැමිණිලි නොමැත. | සේවක අර්ථසාධක දායක මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවිය යුතුය. |
| (ආ) | 1982 අංක 03 දරන පනතෙන් සංශෝධිත 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනතේ 16 හා 27 වන වගන්ති | සේවා යෝජක විසින් එක් එක් මාසයේ දායක මුදල් ඊළඟ මාසය අවසන් දින හෝ ඊට පෙර ගෙවීමට කටයුතු කළ යුතු වුවත්, එසේ කටයුතු නොකර දායක මුදල් ප්‍රමාද වී ගෙවීම මත සමාලෝචිත වර්ෂය තුළදී රු.3,079,098 ක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි. | 2015 සැප්තැම්බර් මස සිට අඛණ්ඩව ගෙවීම් කරන අතර, සියලුම ගණකාධිකාරිවරුන් වෙත ව්‍යවස්ථාවට අනුව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ දායක මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවිය යුතුය. |
| (ඇ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ 05 (1) වගන්තිය | පනතේ විධිවිධාන අනුව සේවයෙන් ඉවත් වූ සේවකයන්හට ඔවුන්ට හිමි පාරිතෝෂික මුදල සේවයෙන් ඉවත්වූ දිනයේ සිට මාසයක් ඇතුළත ගෙවිය යුතු වුවද එලෙස දින 30 ක් ඇතුළත ගෙවීමට කටයුතු නොකිරීම මත මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල 02 ක් සහ ඩිපෝ 12 ක් විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.4,247,571 ක මුදලක් පාරිතෝෂික අධිභාර වශයෙන් ගෙවා තිබුණි. | චක්‍රලේඛ සහ වාචික උපදෙස් මගින් පාරිතෝෂික නියමිත දිනට ගෙවන ලෙස උපදෙස් ලබා දී ඇත. නොගෙවා සිටියේ නම් අදාළ නිලධාරීන්ට මණ්ඩලීය පිළිවෙත් අනුව | පාරිතෝෂික ගෙවීම් රෙගුලාසි ප්‍රකාරව ගෙවිය යුතු අතර නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කටයුතු කරනු ඇත. | |
| (ඇ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 07 (ඉ) වගන්තිය | පනතේ විධිවිධාන අනුව සේවකයාගේ දළ වැටුප රු.25,000 ඉක්මවන අවස්ථාවේදී අයකරනු ලබන රු.25 ක මුද්දර ගාස්තුව සෑම වර්ෂයකම කාර්තුව අවසන් වී දින පහළොවක් ඇතුළත ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, 2024 දෙසැම්බර් 31 වන විට මණ්ඩලයේ සේවකයන්ගේ දළ වැටුප මත අය කරගත් මුද්දර ගාස්තු රු.37,169,665 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. ඉන් රු.5,860,427 ක වටිනාකමක් වසර 01-02 ත් අතර ද, රු.13,701,275 ක් වසර 02-05 ත් අතර ද, රු.9,385,033 ක් වසර 05-10 ත් අතර ද, රු.2,845,143 ක් වසර 10ට වැඩි ශේෂයන්ගෙන් සමන්විත වී තිබුණි. | 2025 වර්ෂය තුළදී මෙම බදු ප්‍රේෂණය කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | පනතේ විධිවිධාන පරිදි මුද්දර ගාස්තු ප්‍රේෂණය කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. | මුදල් රෙගුලාසි 136 සිට 141 දක්වා සහ 225 | 2024 නොවැම්බර් 08 දින සිදු කරන ලද ස්ථානීය විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පරිදි පානදුර ඩිපෝවේ ඩිපෝ කළමනාකරු විසින් හිස් චෙක්පත් 30 ක් සඳහා තම අත්සන යොදා එම හිස් චෙක්පත් සහකාර කළමනාකරු (මුදල්) භාරයේ තබා තිබුණි. | මින් ඉදිරියට මෙවැනි දෝෂයක් සිදු නොකරන ලෙස උපදෙස් ලබා දී ඇත. | චෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතුය. |
| ii. | මුදල් රෙගුලාසි 212 (2) (v) | ගෙවූ වැටුප් අත්තිකාරම් මුළු මුදලම අත්තිකාරම ගෙවූ මාසය අවසානයේදී පඩි ලැයිස්තුවෙන් අඩු කරගත යුතු වුවත්, 2024 වර්ෂය අවසන් දිනය වන විට අත්තිකාරම් ලබා දී වසර 10 ඉක්මවූ රු.2,462,777 ක් ද, වසර 05 ත් 10 ත් අතර රු.1,120,386 ක් ද වසර 02 ත් 05 ත් අතර රු.10,647,065 ක් ද, වසර 01 ත් 02 ත් අතර රු.11,000,771 ක් ද, වශයෙන් එකතු වටිනාකම රු.37,907,808 ක ශේෂයක් පැවතුණි. | අභ්‍යන්තර විගණන අංශයේ උපදෙස් හා නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර එම උපදෙස් අනුව ක්‍රියාමාර්ග ගනු ඇත. | අත්තිකාරම් , රෙගුලාසි ප්‍රකාරව පියවිය යුතුය . |

| | | | | |
|---|---|---|---|---|
| iii. | මුදල් රෙගුලාසි 387 | චෙක්පත් මගින් කෙරෙන සියලුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත්දැයි ගෙවන නිලධාරියා විසින් නිතරම සොයා බැලිය යුතු අතර, කිසිම ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ලබා ගැනීම තහනම් වුවත්, මණ්ඩලය විසින් 2024 දෙසැම්බර් 31 දිනට රු.348,040,115 ක අයිරාවක් පවත්වාගෙන තිබූ අතර, ඒ සඳහා අයිරා පොලිය ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.866,081 ක් ගෙවා තිබුණි. අයිරා පහසුකම් අවශ්‍ය ඩිපෝවන් වෙත අභ්‍යන්තර වශයෙන් අත්තිකාරම් නිකුත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | මින්පසු කිසිදු අයුරකින් අයිරා පහසුකම් ලබා නොගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | බැංකු ගිණුම් වලින් අයිරා පහසුකම් ලබා නොගත යුතුය. |
| i v. | මුදල් රෙගුලාසි 396 (අ) (i) හා (iii) | 2024 දෙසැම්බර් 31 දින වන විට වලංගු කාලය මාස 06 ක් ඉක්මවූ වටිනාකම රු.224,963,319 ක් වන ඩිපෝවන් 10 ක්, ප්‍රාදේශීය කාර්යාල 02 ක්, ප්‍රාදේශීය වැඩපල 03 ක් හා ප්‍රධාන කාර්යාලය විසින් ගෙවීම සඳහා ඉදිරිපත් කරන ලද චෙක්පත් 70 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පැවති මූල්‍ය අර්බුදය මත චෙක්පත් තැන්පත් කර නොමැති බැවින්, ඉදිරියේදී මෙම චෙක්පත් නිවැරදි දිනට නිරාකරණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනුම් දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xxiv වන පරිච්ඡේදය සංශෝධනය කිරීමේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 21/2015 | උත්සව අත්තිකාරම් ශේෂය මාස 08 ක කාලයක් තුළදී අදාළ සේවකයාගේ වැටුපෙන් අය කර ගත යුතු වුවත් , සමාලෝචිත වර්ෂය අවසන් දිනට වසර 10 ඉක්මවූ රු.16,585,447 ක් ද, වසර 05 ත් 10 ත් අතර රු.3,702,189 ක් ද, වසර 02 ක් 05ත් අතර රු.4,570,797 ක් ද, වසර 01 ත් 02 ත් අතර රු.10,730,721 ක ශේෂයක් ද පැවතිණි. ඒ අනුව උත්සව අත්තිකාරම් නිසි කාලය තුළදී අය කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයේ උපදෙස් හා නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ලබා දෙන උපදෙස් අනුව ක්‍රියාමාර්ග ගනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අත්තිකාරම් අයකර ගත යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | වෘත්තීය සමිතියක සමාජිකයන් සංඛ්‍යාව 3,000 ඉක්මවා සිටින විට නිලධාරීන් දෙදෙනෙකු පමණක් පූර්ණකාලීනව මුදා හැරීම සිදු කළ හැකි වුවත්, මණ්ඩලය තුළ | ධාවන කොට්ඨාශයේ 2022 අංක 01 දරන | විධිවිධාන ප්‍රකාරව වෘත්තීය සමිති |

| | | | | |
|---|---|---|---|---|
| | xxv වන පරිච්ඡේදය 4.2 වගන්තිය | ක්‍රියාත්මක වෘත්තීය සමිති 05 ක් වෙනුවෙන් සේවකයන් 22 ක් නිදහස් කර තිබීම හේතුවෙන් වැඩිපුර නිදහස් කර තිබූ නිලධාරීන් 12 දෙනෙකු සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කර නොතිබුණි. | චක්‍රලේඛනයට යටත්ව හා සභාපතිගේ අනුමැතිය යටතේ ලබා දී ඇති බව. | සාමාජිකයින් නිදහස් කිරීම කළ යුතුය. |
| (ඌ) | අංක - 2021/01 දරන 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.9 වගන්තිය | ගිණුම් ශේෂයන් පොත්වලින් ඉවත් කිරීමේදී කළමනාකරණ හා විගණන කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව නිසි ක්‍රමවේද අනුගමනය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය විසින් අනුමත ක්‍රමවේදයට පටහැනිව රු.3,934,404,115 ක වටිනාකමක් පොත් වලින් ඉවත් කර තිබුණි. | වටිනාකමින් සියයට 98 ක් පාරිතෝෂික වෙන් කිරීමට අදාළ වේ. දේශීය මිලදී ගැනීම්, අත්තිකාරම් පියවීමට අදාළ ශේෂයන් මෙහි ඇතුළත් වේ. | ලෙජර් ගිණුම් නිවැරදිව පිළියෙල කිරීමටත්, චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගිණුම් ශේෂයන් කපා හැරීමත් කළ යුතුය. |
| (එ) | අංක පීඊඩී/12 දරන 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, නියමිත දින ඉක්මවා දින 60 ක ප්‍රමාදයකින් පසු 2025 අප්‍රේල් 29 දින මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | අදාළ දෝෂය සිදු වී ඇති බව පිළිගනිමි. | මූල්‍ය ප්‍රකාශන වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඒ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1533 /16 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | ගමනාගමන මණ්ඩලයට අයත් සියලුම ඩිපෝ පරිශ්‍රයන්හි සහ ප්‍රාදේශීය වැඩපල අංගනවල ඇති ඉන්ධන හා ලිහිසි තෙල් අපද්‍රව්‍ය සහ ප්ලාස්ටික් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පිළිගත් අනුමත ක්‍රමවේදයක් අනුගමනය කර පාරිසරික බලපත්‍රයක් ලබා ගත යුතු වුවත්, මණ්ඩලයට අයත් ඩිපෝ 109 න් ඩිපෝ 52 ක් හා ප්‍රාදේශීය වැඩපල 12 න් ප්‍රාදේශීය වැඩපල 08 ක් මෙම පාරිසරික බලපත්‍රය සමාලෝචිත වර්ෂය අවසන් දිනය වන විට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කරුණු 04 ක් නිසා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීමට නොහැකි වී ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් බලපත්‍ර ලබාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,032,142,880 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.1,098,934,630 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,131,077,510 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වැටුප් හා වේතන, පරිපාලන හා ආයතනික වැය, බස්රථ මෙහෙයුම් වැය වැඩිවීම හා වෙනත් ආදායම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ආදායම/වියදම | වර්ෂය (2024) (රු.මි.) | වර්ෂය (2023) (රු.මි.) | වැඩි වීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| මාර්ග ලේඛන ආදායම | 72,748.38 | 72,162.70 | 0.82 |
| අනෙකුත් ආදායම් | 2,682.52 | 4,756.83 | (43.60) |
| බස් රථ මෙහෙයුම් වියදම් | 20,541.71 | 18,610.42 | 10.38 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 39,131.30 | 41,464.74 | (5.6) |
| අනෙකුත් පිරිවැය | 16,165.25 | 15,400.62 | 4.96 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය |
|---|---|---|
| දළ ලාභ අනුපාතය ප්‍රතිශතයක් ලෙස | 3.6 | 2.06 |
| ශුද්ධ ලාභ අනුපාතය ප්‍රතිශතයක් ලෙස | 0.3 | 1.52 |
| ජංගම වත්කම් අනුපාතය | 1.23:1 | 1.24:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 0.95:1 | 0.94:1 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහරගම ඩිපෝව සතුව ඉන්ධන ලීටර් 19,800 ක් ගබඩා කළ හැකි ඉන්ධන පිරවුම්හලක් තිබියදී නියැදි පරීක්ෂාවට ලක් කළ 2024 දෙසැම්බර් මාසය තුළදී රු.6,075,784 ක් වටිනා ඉන්ධන ලීටර් 21,244 ක් පිටස්තර ආයතනයකින් ලාභය බෙදා ගැනීමේ පදනම මත අශෝක් ලේලන්ඩ් සමාගමෙන් ලබා ගත් බස් රථ සඳහා සපයාගෙන තිබූ අතර ඒ සඳහා ගමනාගමන මණ්ඩලයේ නොවන බාහිර රියදුරු මහතුන් විසින් මාර්ග ලේඛන ආදායමින් මුදල් ගෙවා තිබුණි. එම බස් රථ වලට ආසන්න ඩිපෝ මගින් ඉන්ධන සැපයීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මහරගම ඩිපෝව තුළ සිදු වී ඇති මෙම තත්ත්වය සම්බන්ධව විමර්ශනයක් සිදු කිරීමට නියමිත වේ. | බාහිර ආයතන වෙතින් ධාවනය කරන බස් රථ සඳහා ඉන්ධන ලබා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුරුණෑගල දකුණ, කැප්පෙටිපොල සහ බදුල්ල යන ඩිපෝවන් විසින් 2024 වර්ෂයේ මුල් මාස 09 තුළදී තම ටයර් අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීම සඳහා පෙරසවි සහ නැවත පුරවන ලද ටයර් වලින් ටයර් 2,403 ක් නියමිත ප්‍රමිතියෙන් තොරවීම හේතුවෙන් අකාලයේ අසාර්ථක වී තිබූ අතර, එම ටයර් වෙනුවෙන් රු.13,460,013 ක මුදලක් ප්‍රතිදාන ලෙස ටයර් සැපයුම්කරුවන්ගෙන් අය කර ගත යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ටයර් පරිභෝජන වාර්තාවක් සකස් කිරීමට සහ පුහුණුව ලත් අයගේ හිඟයක් පවතින බැවින් අකාලයේ අසාර්ථක වීම් වාර්තා සකස් කිරීම ගැටළුවක් ව පවතී. එමනිසා අය කිරීම් සිදු කිරීමේ ප්‍රමාදයක් තිබේ. | නියමිත ප්‍රමිතියෙන් යුත් පෙරසවි හා නැවත පුරවන ලද ටයර් ලබා ගැනීමටත් ප්‍රතිදාන අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | මහනුවර දකුණ ඩිපෝව තම ටයර් අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීම සඳහා ටයර් පෙරසවි කර ගැනීම හා නැවත පුරවා ගැනීම සැපයුම්කාර ආයතන තුනක් හරහා සිදු කර ගෙන තිබූ අතර, මෙම පෙරසවි සහ නැවත පිරවූ ටයර් අකාලයේ අසාර්ථකවීම් හේතුවෙන් 2022, 2023 හා 2024 වර්ෂයන් සඳහා අය කර ගත යුතු ප්‍රතිදාන ලෙස සැපයුම්කරුවන් වෙත දන්වා රු.13,764,524 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අකාලයේ අසාර්ථක වූ ටයර් පිළිබඳව සැපයුම් ආයතන භෞතිකව පරීක්ෂා කර එකඟතාවයකට නොපැමිණීමත්, අසාර්ථක වූ ටයර් විධිමත් එකඟතාවයකින් තොරව නැවත පිරවීමට යැවීම නිසා සැපයුම්කරුවන්ගේ පරීක්ෂණයට ඉදිරිපත් කිරීමට නොහැකි වීම. | අකාලයේ අසාර්ථක වීම් සඳහා ප්‍රතිදාන අයකර ගත යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොවිඩ් කාල වකවානුව තුළදී රෝහල් කාර්යය මණ්ඩලය ප්‍රවාහනය සඳහා 2020 සහ 2021 වර්ෂයන් වලදී මණ්ඩලයේ බස් රථ යෙදවීමෙන් ලැබිය යුතු රු.169,292,831 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද අයකරගෙන නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත, මූල්‍ය නිලධාරි වෙත ඉල්ලීම් කළද හිඟ මුදල ලැබී නොමැත. | හිඟ මුදල් අය කර ගත යුතුය. |
| (ආ) | වර්ෂ කිහිපයක සිට ගමනාගමන මණ්ඩලයේ බස් රථ මගින් පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ගමනාගමන පහසුකම් ලබා දීම වෙනුවෙන් ඒ ඒ ඩිපෝවන් විසින් රැස් කරනු ලබන වටිනාකම රු. 230,389,309 ක් වූ පොලිස් බස් බලපත්‍ර මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය වෙත එවා තිබුණ ද, ප්‍රතිපූරණය | පොලිස් වවුචර් පත් සම්බන්ධ වාර්තාවක් ප්‍රධාන කාර්යාලය වෙත එවා ඇත. රඳවා තබා ගැනීමට ඉඩ නොමැති බැවින් ඩිපෝවන්හි තබා ගන්නා ලෙස දැනුම් දී | පොලිස් වවුචර් ප්‍රමාදයකින් තොරව ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | කර ගැනීම සඳහා එම බලපත්‍ර පොලිස් දෙපාර්තමේන්තුව වෙත යොමු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වටිනාකම අයකර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම පොලිස් නිලධාරීන්ගේ ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් මණ්ඩලය දරන ලද වියදම් පොලිස් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූරණය කර ගත යුතුය. එහෙත් 2021 වර්ෂයේ සිට 2024 ජූලි මාසය දක්වා මණ්ඩලය විසින් දරා තිබූ රු.10,650,938 ක වවුචර් ප්‍රතිපූරණය සඳහා පොලිස් දෙපාර්තමේන්තුවට යොමු කිරීමට කටයුතු නොකර හොරොව්පතාන ඩිපෝවේ ගබඩා කර තැබීමෙන් එම වියදම් ප්‍රතිපූරණය කර ගැනීමට නොහැකි වී තිබුණි. | ඇත. එක් එක් පොලිස් කොට්ඨාශය වෙත වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමෙන් ඊට අදාළ වටිනාකම ලබා ගැනීමට කටයුතු කර ඇත. | යුතුය. |
| (ඇ) | මධ්‍යම බස් රථ කාර්යාලය සහ නැවතුම්පලට අයත් ඉඩමේ ඇති වෙළඳසැල් 59 ක්, ජංගම කරත්ත 15 ක්, ලංකා බැංකු ශාඛාවක් සහ පොදු වැසිකිලි පද්ධතියක් මාසික හා දෛනික කුලී පදනම මත ලබා දී තිබූ අතර ඒවායින් කඩකුලී ආදායම ලෙස රු.23,565,003 ක් ද, විදුලි ගාස්තු ලෙස රු.5,621,650 ක් ද ජල ගාස්තු ලෙස රු.15,292,580 ක් ද වශයෙන් රු.44,479,233 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලැබිය යුතුව තිබුණ ද, එම ශේෂයන් අය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් ගෙවන ලෙස අදාළ කඩ හිමියන් වෙත ලි.ප.තැ. ලිපි යවා ඇත. නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කර ඇත | විධිමත් ගිවිසුමක් සහිතව බදු දීම් කළ යුතු අතර විදුලි, ජල ගාස්තු ප්‍රමාදයකින් තොරව අයකර ගත යුතුය. |
| (ඇ) | කුලී ගැණුම්කරුවන් වෙත බදු දී තිබූ මධ්‍යම බස් රථ කාර්යාලය තුළ පිහිටි කඩ කාමර 30 ක බදු කුලී ගිවිසුම් සමාලෝචිත වර්ෂය අවසන් දිනය වන විට වසර 05 සිට වසර 47 දක්වා වූ කාලයක් කල් ඉකුත් වී තිබුණ ද, නව ගිවිසුම්වලට එළඹීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | ඉඩම් හිමිකම නාගරික සංවර්ධන අධිකාරිය සතු වන බැවින් හිමිකම ශ්‍රී ලංගමට පවරා ගැනීම සඳහා ඉල්ලීම් කළද, එකඟතාවය ලබා දී නොමැති බැවින් ව්‍යාපාරික ස්ථාන පවරාගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය පියවර ගෙන නොමැත. | නව බදු කුලී ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මධ්‍යම බස් රථ කාර්යාල භූමියේ පිහිටි පොදු වැසිකිලි පද්ධතියේ බදු ගිවිසුමේ කොන්දේසි අංක 21 ට අනුව බදු ගැණුම්කරු විසින් බදු ගිවිසුමේ කොන්දේසි හෝ නියමයන් කිසිවක් කඩවන ආකාරයෙන් ක්‍රියා කළහොත් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම ගිවිසුම අවලංගු | හිඟ මුදල් නොගෙවන්නේ නම් ගිවිසුම් අවලංගු කරන බවටත්, හිඟ මුදල් ගෙවන ලෙසටත් දක්වා ඇත. ගිවිසුම් අවලංගු කිරීම වළක්වාලමින් කොළඹ | අධිකරණ නියෝග සැලකිල්ලට ගනිමින් හිඟ ගාස්තු අයකර ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | වන බවට සඳහන් වුවද කොන්දේසි අංක 04 සහ 13 බදු ගැනුම්කරු විසින් සෘජුවම කඩකර සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.8,960,000 ක් කුලිය ලෙසත් විදුලිය සහ ජලය වෙනුවෙන් රු.15,988,669 ක් වශයෙන් එකතුව රු.24,948,669 ක් නොගෙවා පැහැරහැර තිබුණද, ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | දිසා අධිකරණය වාරණ නියෝග ලබා දී ඇත. ඊට එරෙහිව විරෝධතා ගොනු කර ඇත. | කටයුතු කළ යුතුය. |
| (ඊ) | මාස 10 ක් තුළදී නැවත අය කර ගැනීම සඳහා උපරිමය රු.40,000 කට යටත්ව විශේෂ අත්තිකාරම් ණය මුදලක් මණ්ඩලයේ සේවකයන්ට ලබා දී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් දිනට වසර 01 කට වඩා වැඩි රු.10,472,557 ක විශේෂ අත්තිකාරම් ණය ශේෂයක් පැවතුණද ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දෙනු ලබන උපදෙස් අනුව ඉදිරියේදී මෙම ශේෂ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ඇත. | විශේෂ අත්තිකාරම් ලබාදී මාස 10 ක් තුළදී අය කර ගත යුතුය. |
| (උ) | බාහිර පාර්ශවයන්ගෙන් ලබාගෙන මණ්ඩලය මගින් ධාවනය කරවන අධිසුඛෝපභෝගී බස් රථ සඳහා අවම ශ්‍රී ලංගම ප්‍රතිශතය 2024 අප්‍රේල් 01 දින සිට සියයට 20 ක් දක්වා වැඩි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ පාර්ශවයේ එකඟතාවය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ප්‍රතිශතය ඉහළ නැංවීමට උපදෙස් ලබා දී තිබුණද බාහිර පාර්ශවයන්ගේ එකඟතාවය නොලැබීම හේතුවෙන් තීරණය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | බාහිර පාර්ශවයන් ගේ එකඟතාවය ලබා ගැනිමට පියවර ගෙන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගමනාගමන මණ්ඩලයේ රථ ඇණියේ භාවිතයට අවශ්‍ය අමතර කොටස් හා බස් බොඩි අළුත්වැඩියාව මණ්ඩලය සතු ප්‍රාදේශීය වැඩපල 12 ක් මගින් සිදු කරනු ලබන අතර, 2024 වර්ෂය සඳහා එම වැඩපල වෙත ඒකක 17,928 ක නිෂ්පාදන ඉලක්කයන් ලබාදී තිබූ නමුත් නිෂ්පාදනය කර තිබූ ඒකක ප්‍රමාණය 3,831 ක් විය. ඉන් පෙරසව් ටයර් නිෂ්පාදනය ඉලක්කගත නිෂ්පාදනයෙන් සියයට 16 ක් වූ අතර, බස් බොඩි, ගියර් පෙට්ටි, ඕල්ටනේටර්, ඉන්ධන පොම්ප හා ඉන්ධන විදින නිෂ්පාදනය සියයට 50 ක ඉලක්කයට හෝ ළඟා වී නොතිබුණි. | ප්‍රාදේශීය වැඩපලවල් 13 ක සමස්ථ නිෂ්පාදනය අවම අගයක් ගැනීමට බලපා ඇති කරුණු පාදක කර ගනිමින් නිෂ්පාදන ඉලක්කයන් සංශෝධනය කිරීමට කටයුතු කර ඇත. | නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනිමට අවශ්‍ය පරිදි ක්‍රමවේදයන් වැඩි දියුණු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රථ ඇණිය ප්‍රමාණවත් හා ශක්තිමත් නොවීම හේතුවෙන් රජරට, ඌව සහ වයඹ ප්‍රාදේශීය කාර්යාලයන්ට අයත් ඩිපෝවන් විසින් දුර ගමන් සේවා 77 ක් සහ කෙටි ගමන් සේවා 167 ක්, ධාවනය කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය තුළදී රු.3,052,724,115 ක ඇස්තමේන්තුගත ආදායමක් අහිමි වී තිබුණි. | බස් රථ වසර 10 කට වඩා පැරණි හා රියදුරු, කොන්දොස්තර හිඟය මෙන්ම අළුත්වැඩියාවන් සඳහා ප්‍රමාණවත් ඉංජිනේරු කාර්මික සේවක මහතුන් නොමැතිවීම මෙයට හේතු වී ඇත. | බස් රථ ගමන් සේවා ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගත යුතුය. |
| (ඇ) | ඌව ප්‍රාදේශිකයට අයත් ඩිපෝවන්හි රථ ඇණිය තුළ පවත්නා බස් රථ 113 ක ඉන්ධන පොම්ප අළුත්වැඩියා කිරීමට නොහැකි වීම මත බස් රථවල ඉන්ධන පරිභෝජනය ලීටරයකට කිලෝමීටර් 2.54 ක් වී තිබුණි. මෙම බස් රථවල ඉන්ධන පොම්ප අළුත්වැඩියා කර ඉන්ධන පරිභෝජනය ප්‍රාදේශිකයේ සමස්ථ ඉන්ධන තුලන කිරීම මත ලීටරයකට කිලෝමීටර් 3.1 මට්ටම සලකන විට 2024 වර්ෂයේ ඉන්ධන පරිභෝජනය දළ වශයෙන් රු.3,709,322,727 විය යුතු වුවත් ප්‍රාදේශිකයේ මුළු ඉන්ධන වියදම රු.4,523,564,544 ක් වන නිසා රු.814,241,617 ක් එනම් වියදමෙන් සියයට 18 ක් ඉතිරි කර ගත හැකිව තිබුණි. | ඉන්ධන කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගැනීමට කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | ඉන්ධන පොම්ප කාලීනව අළුත්වැඩියා කළ යුතුය. |

## 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගමේ බස් රථ 20 ක් සඳහා ඩීසල් ලබාදීම මහරගම ඩිපෝව මගින් සිදු කර තිබූ අතර, අදාළ සමාගමේ බස් රථ සඳහා ඉන්ධන ලබා දීමේදී රු.500,000 ක මුදලක් තැන්පතුවක් ලෙස ලබා ගෙන එම මුදල නොඉක්මවන පරිදි ඉන්ධන ලබා දීමට හා එසේ ලබා දුන් ඉන්ධනවල වටිනාකම් පියවීමෙන් පසු නැවත ඉන්ධන ලබාදිය යුතු බවට දක්වා තිබුණ ද, එයට පටහැනිව මහරගම ඩිපෝ කළමනාකාර විසින් යථෝක්ත සමාගමෙන් රු.250,000 ක තැන්පතුවක් පමණක් ලබා ගෙන තැන්පතු මුදල ඉක්මවා රු.3,374,040 ක් වටිනා ඉන්ධන ලීටර් 10,884 ක් සපයා තිබුණි. වර්තමානය වන විට අදාළ සමාගම ඇවර කර තිබූ බැවින් මෙම මුදල අයකර ගත නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබුණු අතර උපදෙස් අනුව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ද ගෙන | අදාළ දෝෂය සිදු වී ඇත. මේ සම්බන්ධව කරුණු සොයා බලා විමර්ශනයක් සිදු කිරීමට නියමිතය. | අභ්‍යන්තර පාලන විධිවිධාන අනුව කටයුතු කිරීම අධීක්ෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. එමෙන්ම අධිවේගී මාර්ග (පුද්) සමාගමෙහි සභාපති විසින් 2023 මැයි සිට මහරගම ඩිපෝවෙන් ඉන්ධන ලබා ගැනීම අත්හිටුවා ඇති බව ඩිපෝ අධිකාරී මහරගම ඩිපෝව වෙත දැනුම්දී තිබුණද එම දිනයෙන් පසු රු.2,291,900 ක් වටිනා ඉන්ධන ලීටර් 7,390 ක් ගිවිසුමකින් හා නිසි අවසරයකින් තොරව මහරගම ඩිපෝව විසින් සපයා තිබුණි. | | |
| (ආ) | NC සහ NB කාණ්ඩවලට අයත් බස් රථ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් මණ්ඩලය සතුව ඇති ප්‍රාදේශීය වැඩපළවල් සතුව තිබියදී, පානදුර ඩිපෝවේ NC කාණ්ඩයේ බස් රථ 02 ක් හා NB කාණ්ඩයේ බස් රථයක් ලෙස බස්රථ 03 ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර මණ්ඩලයේ සභාපතිගේ වාචික උපදෙස් මත බාහිර ආයතනයක් මගින් රු.15,138,974 කට සමාලෝචිත වර්ෂය තුළදී අළුත්වැඩියා කර ගෙන තිබුණි. | නියමු ව්‍යාපෘතියක් ලෙස නියෝජිත ආයතනය වෙත යවා සම්පූර්ණ අළුත්වැඩියා කර ධාවනයට ලබාදීමට බස් රථ 03 ආයතනය වෙත යොමු කරන ලදී. | අළුත්වැඩියා කටයුතු සඳහා මණ්ඩලයේ සම්පත් උපරිම වශයෙන් යොදාගත යුතුය. |
| (ඇ) | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) ගේ චක්‍රලේඛයේ සඳහන් වැටුප් අත්තිකාරම් ගෙවිය යුතු දිනයන්ට පටහැනිව බදුල්ල ඩිපෝව විසින් 2024 මැයි, ජුනි හා ජූලි මාසවලදී පඩි සහාගත සේවකයන් සඳහා රු.6,718,000 ක අත්තිකාරම් මුදලක් හා පඩි සහාගත නොවන සේවකයන් සඳහා රු.1,109,000 ක වැටුප් අත්තිකාරම් මුදලක් වශයෙන් එකතුව රු.7,827,000 ක මුදලක් චක්‍රලේඛයට පටහැනිව ගෙවීමට බදුල්ල ඩිපෝ කළමනාකරණය කටයුතු කර තිබුණි. | සේවක හා වෘත්තීය සමිති නිලධාරී මහතුන්ගේ ඉල්ලීම මත හිටපු සහකාර ඩිපෝ අධිකාරී තැන විසින් සේවකයින් සඳහා මෙම වේතන අත්තිකාරම් මුදල් ගෙවීම් කර ඇත. | වැටුප් අත්තිකාරම් සම්බන්ධව චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | කළුතර, රුහුණ, ඌව, ගම්පහ, සබරගමුව ප්‍රාදේශික වලට අයත් කාර්ය මණ්ඩලය සඳහා මහජන බැංකුව විසින් උත්සව අත්තිකාරම් ලබා දී තිබූ අතර එම අත්තිකාරම් වලට අදාළ වාරික හා පොලිය අදාළ සේවකයාගේ වැටුප් බැර වන ගිණුමෙන් අයකර ගනියි. එම ගිණුම් වල ප්‍රමාණවත් මුදලක් නොමැති වූ විට වාරික හා පොලිය අදාළ ඩිපෝ ගිණුමෙන් අයකර ගැනීමට ප්‍රධාන කාර්යාලයේ අනුමැතියකින් තොරව එම ඩිපෝවන් එකඟ වී තිබූ අතර, ඒ අනුව 2024 දෙසැම්බර් 31 දින වන විට රු.4,790,539 ක් මණ්ඩලයේ බැංකු ජංගම ගිණුම් වලින් අයකර ගෙන තිබුණ ද, ඒ සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2011 හා 2012 වර්ෂවල ලබා දුන් උත්සව අත්තිකාරම් වලට අදාළ මුදලකි. නිසි පරිදි සේවකයින්ගේ වැටුපෙන් අය කර ගෙන ඇති අතර, ස්ථාන මාරු සේවකයන්ගේ මුදල් අදාළ ඩිපෝවන් විසින් එකී සේවකයන්ගෙන් අය කර ගෙන ඇති නමුත් එකී ඩිපෝවන් විසින් අදාළ ඩිපෝවන් වෙත මුදල් ලබා නොදීම නිසා මෙම ශේෂය ඉදිරියට පැවත එනු ලැබේ. ඉදිරියේදී නිවැරදි කිරීමට | ඩිපෝ අතර සිදුවන අභ්‍යන්තර ගණුදෙනු සැසඳිය යුතු අතර බැංකු ජංගම ගිණුම් වලින් ප්‍රධාන කාර්යාලීය අවසරයකින් තොරව සෘජු හර කිරීම් සඳහා අවසර ලබා නොදිය යුතුය. |

| | | |
|---|---|---|
| | කටයුතු කරනු ඇත. මහජන බැංකුව විසින් තම මුදල් ඩිපෝ ජංගම ගිණුමෙන් අය කර ඇත. | |

### 3.6 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සාමාන්‍ය බස් රථ සඳහා රු.මිලියන 2,850 කට නව එන්ජින් කට්ටල් 285 ක් මිලදී ගෙන රථ ඇණිය ශක්තිමත් කිරීමට ඉලක්ක කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 502 කට එන්ජින් කට්ටල් 70 ක් පමණක් මිලදීගෙන තිබුණි. එමෙන්ම රු.මිලියන 800 ක් වෙන්කර ධාවනයෙන් ඉවත් වී තිබූ බස් රථ 400 ක් ඩිපෝ මගින් පුනරුත්ථාපනය කර රථ ඇණියට එක් කිරීමට ඉලක්ක කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළදී බස් රථ 90 ක් පමණක් රු.මිලියන 120 ක වියදමකින් පුනරුත්ථාපනය කර තිබුණි. | අයවැයෙන් එම යෝජනා සඳහා ප්‍රතිපාදන නොලැබීම මත ව්‍යාපෘතිය අකර්මන්‍ය විය. ශ්‍රී ලංගම මූල්‍ය ප්‍රතිපාදන යටතේ එංජින් කට්ටල 70 ක් මිලදී ගෙන රථ ඇණිය ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදී. | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර ඒවා ඵලදායීව උපයෝජනය කර කාර්යසාධන ඉලක්ක ළඟාකර ගත යුතුය. |

### 3.7 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බදුල්ල නගර මධ්‍යයේ මණ්ඩලයට අයත්ව ඇති කොතලාවල වලව් පිය නිවස ඉඩමෙහි පර්චස් 20 ක් වෙන් කර එහි වායු විමෝචන මධ්‍යස්ථානයක් රු.9,922,223 ක පිරිවැයකට 2016 වර්ෂයේදි ඉදි කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වායු විමෝචන මධ්‍යස්ථානයෙහි කටයුතු අධිකරණ වාරණ නියෝගයක් හේතුවෙන් ආරම්භ කර නොතිබූ බැවින් ඒ වෙනුවෙන් දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි. | මෙම පරීක්ෂණ සිදු කරනු ලබන ප්‍රධාන ආයතන දෙක මගින් තෙවන පාර්ශවයකට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු අහුරමින් අධිකරණය මගින් වාරණ නියෝගයක් ලබා ගැනීමට කටයුතු කොට ඇත. පුහුණු කණ්ඩායමක් නොමැති වීම, ඩීසල් තොග පමණක් පරීක්ෂා කළ හැකි වීම ව්‍යාපෘතිය අකර්මන්‍ය වීමට බලපා ඇති සාධක බවට පෙන්වා දිය හැක. | ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුව අදාළ අනුමැතීන් ලබා ගැනීමෙන් පසු ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සීමාසහිත අධිවේගී මාර්ග ප්‍රවාහන සමාගම සතුව පැවති බස් රථ 20 ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට 2023 ජූලි හා ඔක්තෝබර් මාසයන්හි පවරා ගෙන අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවය | බස් රථ 07 ක් සුළු අළුත්වැඩියාවෙන් පසු ධාවනයට එක් කර ඇත. අනෙක් බස් රථ 13 අළුත්වැඩියා කළ විගස | ප්‍රමාදයකින් තොරව අළුත්වැඩියාව න් කර බස් රථ ධාවනයට |

| | | | |
|---|---|---|---|
| | වෙත ලබා දී තිබුණි. අමතර කොටස් නොමැති වීම හේතුවෙන් ඉන් බස් රථ 17 ක් 2025 මැයි මාසය වන විට දින 618 ක් ද, මණ්ඩලය සතුව පැවති බස් රථ වලින් 13 ක් දින 30 ත් 1,283 ත් අතර කාල පරාසයක් ධාවනයෙන් ඉවත්ව ගාල්කර තිබුණි. | ධාවනයට එක් කිරීමට සුදානම් කර ඇත. | එක් කළ යුතුය. |

## 3.8 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගමනාගමන මණ්ඩලයේ රථ ඇණිය සඳහා අවශ්‍ය ටයර් නැවත පිරවීම සහ පෙරසවි කිරීම සඳහා 2017 වර්ෂයෙන් පසුව ප්‍රසම්පාදනයක් සිදුකිරීමකින් තොරව 2017 වර්ෂයේ තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් අඛණ්ඩව මිලදී ගෙන තිබූ අතර, මිල උච්චාවචනය පාදක කරගෙන වරින් වර මිල ගණන්ද සංශෝධනය කර තිබුණි. 2023 වර්ෂයේ මාස 04 ක අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීම සඳහා ලංසු කැඳවා තිබූ අතර, එහිදී ඉදිරිපත් වූ ලංසුකරුවන් 17 දෙනෙකුගෙන් 14 දෙනෙකු සාරානුකූල ලංසුකරුවන් ලෙස තෝරාගෙන තිබුණි. නමුත් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලබා දී තිබූ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කිරීමකින් තොරව ලංසු කැඳවීමට පෙර සලකා බැලිය යුතු කරුණු හා සාධක සලකා බැලීමට යටත්ව අනුමැතිය ලබාදීමට කල්දමා තිබීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විටද ටයර් නැවත පිරවීම හා පෙරසවි කිරීම සඳහා වූ ටෙන්ඩරය පිරිනමා නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී 825x20, 900x20 සහ 1000x20 වර්ගයේ ටයර් 135,311 ක් නැවත පිරවීම හා පෙරසවි කිරීම වෙනුවෙන් රු.2,295,270,893 ක් ගෙවා තිබූ අතර නව ටෙන්ඩරය සඳහා සැපයුම්කරුවන්ට ගෙවිය යුතුව තිබූ වටිනාකම රු.2,037,911,412 ක් වීමෙන් රු.257,359,481 ක් නව ටෙන්ඩරය අනුමත නොකිරීම හේතුවෙන් වැඩිපුර ගෙවා තිබුණි. | මාස 04 ක අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා සංශෝධනය කරන ලද මිල ගණන් යටතේ තවදුරටත් ටයර් නැවත පිරවීම සහ පෙරසවි කිරීම කර ගැනීමට සිදුවිය. අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව සියයට 10 කින් මිල ගණන් සංශෝධනය කිරීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව ටයර් නැවත පිරවීම හා පෙරසවි කිරීම කළ යුතුය. |
| (ආ) | 2024 වර්ෂයේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට අනුව රු.මිලියන 65,125 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 59 ක් සැලසුම්කර තිබුණ ද, 2024 වර්ෂය තුළදී රු.මිලියන 8,967 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 16 ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව 2024 වර්ෂයේ | රියදුරු අභ්‍යාස විද්‍යාල සඳහා යතුරුපැදි 05 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය නතර කර ඇත. අනෙකුත් ප්‍රසම්පාදන 2025 වර්ෂයේ ක්‍රියාත්මක | වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රසම්පාදනය න් කළ යුතුය. |

| | | |
|---|---|---|
| අයවැයට ඇතුළත් කරන ලද ප්‍රසම්පාදන වියදමෙන් සියයට 13.77 ක් උපයෝජනය කර නොතිබුණි. | වෙමින් පවතී. | |

3.9 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 24,886 ක් වුවද 2024 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව 25,384 ක් විය. ඒ අනුව කම්කරු මට්ටමේ තනතුරු කිහිපයකට අදාළව සේවකයන් 498 ක අතිරික්තයක්ද, මණ්ඩලයේ කළමනාකරණ මට්ටමේ තනතුරු 06 කට අදාළව පුරප්පාඩු 102 ක් ද ඇති බැව් කළමනාකරණය දන්වා තිබුණද ඒ ඒ තනතුරුවලට අදාළව අනුමත, තත්‍ය, පුරප්පාඩු හා අතිරික්ත ප්‍රමාණ පිළිබඳ නිශ්චිත තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කාර්ය මණ්ඩලය අනුමත කර ඇත. 27,592 ක කාර්යය මණ්ඩලයක් අනුමත කරන ලෙස ඉල්ලා ඇත. සේවකයින් අදාළ වැටුප් කේතයන්ට තවම අන්තර්ග්‍රහනය කර නොමැත. ස්ථිර පදනමින් අභ්‍යන්තර බඳවා ගැනීම් සිදු කිරීමට නොහැක. | මානව සම්පත් කළමණාකරණයට අදාල දත්ත පද්ධතියක් ස්ථාපිත කළ යුතු අතර අනුමැතීන්ට යටත්ව අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |